- **ලියාපදිංචි ගාස්තුව:** රුපියල් 2,500කි.
- **ලියාපදිංචියේ දී හිමිවන දේ:** නිල ජම්බෝරි සේවා කණ්ඩායම් ඇඳුම් කට්ටලය, සේවා කාලය තුළ ආහාර, ජම්බෝරි යොවුන් කඳවුරේ නවාතැන් පහසුකම්, සහභාගීත්ව සහතික පත්‍රය, ජම්බෝරි පදක්කම (Badge) ලැබෙනු ඇත.
- **ගෙවීම් ක්‍රියාවලිය:** උපදෙස් වලට අනුකූලව ලියාපදිංචිය සම්පූර්ණ කර අදාල පරිදි ලියාපදිංචි ගාස්තුව ගෙවිය යුතුය.
- ඉහත අවශ්‍යතාවන් සපුරාලන ඕනෑම සමාජික සංඛ්‍යාවකට ජම්බෝරි සේවා කණ්ඩායම (JST) සඳහා ලියාපදිංචි විය හැකිය.

ලියාපදිංචි වීමේ උපදෙස්

ලියාපදිංචි වීමට පෙර පහත උපදෙස් හොඳින් කියවා ලියාපදිංචිය සිදු කිරීමට කටයුතු කරන්න.

ලියාපදිංචි කිරීම

Download link – http://jamboree.scout.lk/JST_Application වෙතින් JST අයදුම්පත බාගත කර, අදාළ දිසා කොමසාරිස්වරයාගේ නිර්දේශය සහ අනුමැතිය සහිතව සම්පූර්ණ කළ යුතුය.

ජම්බෝරි ලියාපදිංචි ගාස්තු ගෙවීම

අදාල ගාස්තුව **2026 සැප්තැම්බර් 30** වන දින හෝ ඊට පෙර අයදුම්පතෙහි සඳහන් පරිදි ශ්‍රී ලංකා ජාතික බාලදක්ෂ මූලස්ථානයේ ගිණුමට තැන්පත් කිරීම සිදු කළ යුතුය.

ලියාපදිංචි තොරතුරු ජාතික මූලස්ථානය වෙත ඉදිරිපත් කිරීම

නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත හා ලියාපදිංචි ගාස්තු ගෙවන ලද රිසිට් පත සමගින් **2026 සැප්තැම්බර් 30** වන දින හෝ ඊට පෙර **jst@jamboree.scout.lk යන ඊමේල් ලිපිනය ට** ඊමේල් හරහා ජාතික බාලදක්ෂ මූලස්ථානය වෙත යොමු කිරීමට කටයුතු කළ යුතුය.

ජම්බෝරි සේවා කණ්ඩායම් සාමාජිකයින් සඳහා යොමු කර ඇති අයදුම්පත් සහ මෙහෙයුම් අවශ්‍යතා සමාලෝචනය කිරීමෙන් පසු, 2026 ඔක්තෝබර් තුන්වන සතිය වන විට ජම්බෝරි සේවා කණ්ඩායම් සාමාජිකයින් අදාළ අංශ වෙත අනුයුක්ත කෙරේ.

ජම්බෝරිය අතරතුර හානියෙන් සුරක්ෂාව (Safe from Harm)

11 වන ජාතික බාලදක්ෂ ජම්බෝරිය පුරා සියලුම සහභාගිවන්නන් සඳහා ආරක්ෂිත පරිසරයක් ඇතිකරලීමට ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමය කැපවී සිටියි.

ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමයේ හානියෙන් සුරක්ෂාව ප්‍රතිපත්තියට **(Safe from Harm)** අනුකූලව, වයස අවුරුදු 18 සහ ඊට වැඩි සියලුම සහභාගිවන්නන් සහ නායකයින් ජම්බෝරියට පෙර හානියෙන් සුරක්ෂාව **(Safe from Harm)** මාර්ගගත පුහුණු පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කිරීම අනිවාර්ය වේ. **(www.scout.edu.lk)**

මේ පිළිබඳ විස්තරාත්මක චක්‍රලේඛයක් ඉදිරියේ දී නිකුත් කරනු ඇත. මෙහිදී සියලුම දිසා කොමසාරිස්වරුන්ගේ සහ නායකයින්ගේ සහයෝගය බෙහෙවින් අගය කරනු ලැබේ.

ජම්බෝරියට සහභාගී වන සෑම සහභාගිවන්නෙකුටම ආරක්ෂිත සහ ධනාත්මක පරිසරයක් පවත්වා ගැනීම අත්‍යවශ්‍ය බැවින්, මෙම අවශ්‍යතාවයට අනුකූල වීම සහතික කිරීමේ දී සියලුම දිසා කොමසාරිස්වරුන්ගේ සහ නායකයින් සහයෝගය බෙහෙවින් අගය කරනු ලැබේ.

65/9, Sir Chittampalam A Gardiner Mawatha, Colombo 02, Sri Lanka +94 112 433 131 / 512 info@jamboree.scout.lk jamboree.scout.lk